බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය
සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය.

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : බන්ධනාගාර යොමු අංකය : ඩී8/21/බ.පරි./රියදුරු දිනය : 2014.01.28

1.2 අමාත්‍යාංශය : පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ යොමු අංකය : MRPR/2/3/07-1/V-02 දිනය : 2014.02.06

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : යොමු අංකය : ඩී.එම්.එස්/ඩී2/48/01/Vol.II දිනය : 2013.09.24

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : යොමු අංකය : EST-2/RECRU/05/4864 දිනය : 2014.03.14

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය : යොමු අංකය :NPC/6/18/096/SR දිනය : 2014.02.26

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : යොමු අංකය : PSC/EST/02-01-18/01/2014 දිනය : 2014.11.28

02. පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : ප්‍රාථමික ශිල්පීය

3.2 ශ්‍රේණි :III,II, I, විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයක් වෙත පැවරෙන කාර්යයන් ඉටුකිරීම හා පවත්වාගෙන යාම සඳහා වන මූලික අවශ්‍යතාවයන් වන ප්‍රවාහන කාර්යයන්හි අවශ්‍ය වන මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කෙරෙන මෝටර් රථ රියදුරු බලපත්‍රයක් දරණ තැනැත්තන්ගෙන් සමන්විත සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත.

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : PL 3-2006 A

5.2 වැටුප් පරිමාණය : 12470 - 10x130 - 10x145 - 10x160 - 12x170 x 18860

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| III | 01 | 12470 |
| II | 12 | 13915 |
| I | 22 | 15380 |
| විශේෂ ශ්‍රේණිය | 32 | 16990 |

06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| රියදුරු<br>ගිලන්රථ රියදුරු | III, II, I, විශේෂ ශ්‍රේණි<br>III, II, I, විශේෂ ශ්‍රේණි | 172<br>03 | බලධාරීන් විසින් පවරා ඇති පරිදි බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සහ බන්ධනාගාර ගත නේවාසිකයින් ආරක්ෂණය කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

රියදුරු - 172
ගිලන් රථ රියදුරු - 03

" ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I හා විශේෂ යන ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ."

07. බඳවාගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | 100 % |
| කුසලතා | - |

පළමුව අභ්‍යන්තර අයදුම්පත් කැඳවන අතර, සුදුසුකම් ලත් නිලධාරීන් නොමැති නම් බාහිරින් බඳවාගනු ලැබේ.

7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් සම්මාන දෙක (2) ක් සහිතව විෂයයන් හය (06) ක් සමත්ව තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල මෝටර් රථ පැදවීමේ බර වාහන වලංගු බලපත්‍රයක් ලබා තිබීම.

7.2.2.3 පළපුරුද්ද : මෝටර් රථ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

7.2.2.4 කායික සුදුසුකම් :

I. අවම උස අඩි 5 අඟල් 4 (පිරිමි) නොඅඩු විය යුතුය.
II. අයදුම්කරුවන් සඳහා පපුවේ හුස්ම නාල්ලා අඟල් 32ක් විය යුතුයි. මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතු අතර, යහපත් චරිතයකින් ද යුක්ත අයවලුන් විය යුතුයි. චරිත දූෂණයට අදාළ වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම ඉහත තනතුරට පත් වීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේය.
III. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

1. ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුයි.
2. තනතුරට බඳවා ගැනීම සඳහා 7.2.2.1 සිට 7.2.2.5 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවන නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතුය.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18
7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 45

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.2.4.1 ලිඛිත විභාගය :

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණ හා කාර්මික දැනුම | 100% | 40% |

7.2.4.1.1 පවත්වන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| I. මාර්ග නීති<br>II. මාර්ග සංඥා<br>III. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් පත් කරනු ලබන පරීක්ෂක වරයෙකු, පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකු සහ දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියෙකු විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය. | 100% | 40% |

7.2.4.2.1 පවත්වන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ)
ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණි.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පත් කරනු බලන බලධරයා

බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ : අදාළ නොවේ.

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීමක් පලකිරීමෙන් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් පලකිරීම සහ වෙබ් අඩවියේ පලකිරීම මගින් කැඳවනු ලැබේ.

7.3. **සීමිත බඳවා ගැනීම :**

7.3.1. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදි යටත් පිරිසෙයින් සම්මාන දෙක (2) ක් සහිතව විෂයයන් හය (06) ක් සමත්ව තිබීම.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ ස්ථිර කර ඇති තනතුර වසර 05 ක ස්ථිර සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල මෝටර් රථ පැදවීමේ බර වාහන වලංගු බලපත්‍රයක් ලබා තිබීම.

7.3.2.3 පළපුරුද්ද : මෝටර් රථ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පලපුරුද්දක් ලබා තිබීම. (ආදේශක රියදුරෙකු ලෙස සේවය කිරීම විශේෂ සුදුසුකමකි)

7.3.2.4 කායික සුදුසුකම :

I. අවම උස අඩි 5 අඟල් 4 (පිරිමි) නොඅඩු විය යුතුය.
II. අයදුම්කරුවන් සඳහා පපුව හුස්ම නාල්ලා අගල් 32ක් විය යුතුයි.

7.3.2.5 වෙනත් :

1. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
2. තනතුරට බඳවා ගැනීම සඳහා 7.2.2.1 සිට 7.2.2.5 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවන නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතුය.

7.3.3 බඳවා ගැනීමේ ක්‍රමය :

7.3.3.1 ලිඛිත විභාගය :

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණ හා කාර්මික දැනුම | 100% | 40% |

7.3.3.1.1 පවත්වන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

7.3.3.2 වෘත්තීය පරීක්ෂණය

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| I. මාර්ග නීති<br>II. මාර්ග සංඥා<br>III. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් පත් කරනු ලබන පරීක්ෂක වරයෙකු, පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකු සහ දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියෙකු විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය. | 100% | 40% |

7.3.3.2.1 පවත්වන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්.

7.3.3.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ)

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණි.

7.3.3.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පත් කරනු බලන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

7.3.4 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : බන්ධනාගාර ආයතන ප්‍රධානීන් වෙත අයදුම්පත් කැඳවීමේ නිවේදනය නිකුත් කර නිලධාරීන් දැනුවත් කිරීම මගින්

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම.

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද. | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර. | ඇමුණුම 02 බලන්න |
| II වන කාර්යක්ෂමතා කඩඉම | II වෙනි ශ්‍රේණියට උසස් වී වසර තුන (03)ක් ගතවීමට පෙර. | ඇමුණුම 03 බලන්න |
| III වන කාර්යක්ෂමතා කඩඉම | I වෙනි ශ්‍රේණියට උසස් වී වසර පහ (05)ක් ගතවීමට පෙර. | ඇමුණුම 04 බලන්න |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

09. භාෂා ප්‍රවීණතාවය

9.1

| ශ්‍රේණිය | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 1. භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම :

10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.

10.1.1 සාමාන්‍ය කාර්ය සාධන කටයුතු

10.1.1.1 **සපුරාලිය යුතු සුදුසුකම් :**

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය(10) උපයාගෙන තිබීම.

III. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

V. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

VI. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබාගෙන තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීමට පත්කිරීමේ බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1. **සපුරාලිය යුතු සුදුසුකම් :**

I. සේවා ගණයේ II ශ්‍රේණියේ වසර නවය (09)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක නවය (09)ක් උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් පෙන්නුම් කර තිබීම

III. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්ව තිබීම.

IV. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කිරීමේ බලධරයා විසින් සිදුකරනු ලැබේ.

10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

10.3.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.3.1.1. **සපුරාලිය යුතු සුදුසුකම්** :

**I.** සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09)ක් උපයාගෙන තිබීම.
**II.** අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීම් දිනට පෙරාතුව වූ වසර නවය 9 තුලම සතුටුදායක මට්ටමේ හෝ ඊට අදාළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
**III.** අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.
**IV.** උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් පෙන්නුම් කර තිබීම.

10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීමේ බලධාරියා විසින් සිදුකරනු ලැබේ.

සංලක්ෂය : • සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීමේ දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11. තනතුරට පත් කිරීම : අදාළ නොවේ.

12. අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ :

සක්‍රීය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයේ අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය

**සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම. (නියමිත දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ.)**

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුශාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති PL-03-2016 වැටුප් ප්‍රමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියලුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත්කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වෙතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

1. PL-03-III ශ්‍රේණිය
   බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රියදුරු තනතුරේ යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්
   **PL-03-III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරණු ලැබේ.**

2. PL-03-II ශ්‍රේණිය
   බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රියදුරු තනතුරේ යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) කට නොඅඩු එහෙත් විස්ස (20) කට නොවැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්
   **PL-03-II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරණු ලැබේ.**

3. PL-03-I ශ්‍රේණිය
   බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රියදුරු තනතුරේ යටත් පිරිසෙයින් අවුරුදු විස්ස (20) කට වැඩි තිහ (30)කට අඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්
   **PL-03-I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරණු ලැබේ.**

4. PL-03 විශේෂ ශ්‍රේණිය
   බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රියදුරු තනතුරේ අවුරුදු තිහ (30) කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්
   **PL-03 විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරණු ලැබේ.**

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධි විධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ : අත්සන : ..........................................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : **සී.එස්. අමරවික්‍රම පරිපාලන නිලධාරි I**

තනතුර : **බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට**

දිනය : 2017.03.23

පරීක්ෂා කළේ : අත්සන : ..........................................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : **එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය**

තනතුර : **බන්ධනාගාර කොමසාරිස් (පාලන) බන්ධනාගාර මූලස්ථානය කොළඹ 09.**

දිනය : 2017.03.27

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : **එච්.එම්.එන්.සී. ධනසිංහ**

තනතුර : **බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**

නිල මුද්‍රාව : **බන්ධනාගාර මූලස්ථානය කොළඹ 09.**

දිනය : 2017.03.27

යොමු අංකය : MPRRH/6/2/Pn/පිය.ආකෘ6

බන්ධනාගාර දෙපාර්තමේන්තුව හි පියදුරු

තනතුර සදහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ............

නම : ............

ලේකම්

............ අමාත්‍යාංශය

දිනය : 2017.05.08

නිල මුද්‍රාව : ඩබ්. එම්. පී. පී. වික්‍රමසිංහ
ලේකම්
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන,
නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික
කටයුතු අමාත්‍යාංශය
අංක 356 බී, ගාලු පාර, කොළඹ 03.

---

යොමු අංකය : PSC/EST/02-01-18/01/2014

බන්ධනාගාර දෙපාර්තමේන්තුව හි තෘ.ඒ.වික.ශිල්පීය සේවා ශ්‍රේ.ය

සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2014.11.28 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ............

නම : ............

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2017.05.29

නිල මුද්‍රාව : ............

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

ඇමුණුම 01

<u>විභාග පිළිබඳ ආකෘතිය</u>

1. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය බන්ධනාගාර රියදුරු අභ්‍යන්තර හා බාහිර බඳවා ගැනීම.

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම | පැය 01 | 100% | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

4. විභාගය පවත්වන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු අනුව වසරකට වරක්

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත් තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි |
| කාර්මික දැනුම | වාහන නඩත්තුව සහ එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුම අපේක්ෂා කිරීම. |

සකස් කළේ :
අත්සන :..............................
නම : සී.එස්. අමරවික්‍රම
පරිපාලන නිලධාරි I
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය : 2017.01. 25

පරීක්ෂා කළේ :
අත්සන :..............................
නම : එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය
බන්ධනාගාර කොමසාරිස් (පාලන)
තනතුර : ...බන්ධනාගාර මූලස්ථානය
දිනය : 2017.03. 27

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : එච්.එම්.එන්.සී. ධනසිංහ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
දිනය : 2017.03.27
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
නිල මුද්‍රාව : ..............................

ඇමුණුම 02

<u>විභාග පිළිබඳ ආකෘතිය</u>

1. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය

බන්ධනාගාර රියදුරු අභ්‍යන්තර කාර්යක්ෂමතා කඩයිම් විභාගය I

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රයේ නම | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| මෝටර් යාන්ත්‍රික විද්‍යා සහ මාර්ග නීති සංග්‍රහය පිළිබඳ දැනුම | පැය 01 | 100% | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින්.

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව හා මාර්ග නීති | I වන කාර්යක්ෂමතා කඩඉමට අදාළ දැනීමට වඩා වැඩි දැනුමක් මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව අපේක්ෂා කරන අතර, මාර්ග නීති රීති පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ. |

සකස් කළේ :

අත්සන :..........................................

නම : සී.එස්. අමරවික්‍රම

පරිපාලන නිලධාරී I

තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට

දිනය : 2017.01. 23

පරීක්ෂා කළේ :

අත්සන :..........................................

නම : එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය

බන්ධනාගාර කොමසාරිස් (පාලන)

තනතුර : බන්ධනාගාර මූලස්ථානය

කොළඹ 09.

දිනය : 2017.03. 27

අත්සන : ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : එච්.එම්.එන්.සී. ධනසිංහ

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

තනතුර : බන්ධනාගාර මූලස්ථානය

කොළඹ 09.

දිනය : 2017.03. 27

නිල මුද්‍රාව : ..........................................

ඇමුණුම 03

<u>විභාග පිළිබඳ ආකෘතිය</u>

1. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පී සේවා ගණය

බන්ධනාගාර රියදුරු අභ්‍යන්තර කාර්යක්ෂමතා කඩඉම් විභාගය II

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රයේ නම | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
| --- | --- | --- | --- |
| මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව හා මාර්ග නීති පිළිබඳ දැනුම | පැය 01 | 100% | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
| --- | --- |
| මෝටර්රථ යාන්ත්‍රික විද්‍යාව හා මාර්ග නීති | I වන කාර්යක්ෂමතා කඩඉමට අදාළ දැනීමට වඩා වැඩි දැනුමක් මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව අපේක්ෂා කරන අතර, මාර්ග නීති රීති පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ. |

සකස් කළේ :

අත්සන :..........................................

නම :.......... සී.එස්. අමරවික්‍රම පරිපාලන නිලධාරී I

තනතුර බන්ධනාගාර කොමසාරිස් ජනරාල් කාර්යාලය

දිනය :2017.01. 27

පරීක්ෂා කළේ :

අත්සන :..........................................

නම :.......... එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය බන්ධනාගාර කොමසාරිස් (සංවර්ධන)

තනතුර :.......... බන්ධනාගාර මූලස්ථානය කොළඹ 09.

දිනය :2017.03.27

අත්සන :..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :.......... එච්.එම්.එන්.සී. ධනසිංහ

තනතුර :.......... බන්ධනාගාර කොමසාරිස් ජනරාල් බන්ධනාගාර මූලස්ථානය කොළඹ 09.

දිනය : 2017.03.27

නිල මුද්‍රාව :..........................................

ඇමුණුම 04

<u>විභාග පිළිබඳ ආකෘතිය</u>

1. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පී සේවා ගණය
බන්ධනාගාර රියදුරු අභ්‍යන්තර කාර්යක්ෂමතා කඩයිම් විභාගය III

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව හා මාර්ග නීති පිළිබඳ දැනුම | පැය 01 | 100% | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින්

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව හා මාර්ග නීති පිළිබඳ දැනුම | මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව උසස් දැනීමක් අපේක්ෂා කරන අතර, මාර්ග නීති රීති පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ. |

සකස් කළේ :
අත්සන :
නම : සී.එස්. අමරවික්‍රම
පරිපාලන නිලධාරී I
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය :2017.01. 23

පරීක්ෂා කළේ :
අත්සන :
නම : එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය
බන්ධනාගාර කොමසාරිස් (පාලන)
තනතුර : බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
දිනය :2017.01.27

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : එච්.එම්.එන්.සී. [illegible]
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
දිනය : 2017.01.27
නිල මුද්‍රාව :